සබරගමුව පළාත් අධ්‍යාපන දෙපර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2026 - 13 ශ්‍රේණිය
Final Term Test – 2026 – Grade 13

ව්‍යාපාර අධ්‍යයනය - I **Business Studies - I**	**32 S I**	**කාලය / Time** — **පැය දෙකයි. / Two hours**

විභාග අංකය:.....

උපදෙස් :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරයෙන් ඇති තිත් ඉරමත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරිමත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.

---

01. පහත දැක්වෙන්නේ අවශ්‍යතා හා වුවමනා වල ලක්ෂණ කිහිපයකි.

A – අත්‍යවශයෙන්ම සපුරා ගත යුතුය
B – ව්‍යාපාරිකයාට නිර්මාණය කළ හැක.
C – අසීමිත බව
D – සෑම පුද්ගලයාටම පොදුය.
E – පුද්ගල බද්ධය
F – සීමිත බව
G – පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධය
H – සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැක.

ඉහත දෑ අතුරින් අවශ්‍යතාවල ලක්ෂණ පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) A, C, F, H (2) A, D, F, H (3) B, C, E, G
(4) C, D, F, G (5) B, D, E, F (.....)

02. ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?

(1) ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයේදී වෙළෙඳාම බිහිවීම සිදුවිය.
(2) ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයේදී සෘජු නිෂ්පාදනය සිදු විය.
(3) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස මුදල් භාවිතයට පැමිණීම සිදු විය.
(4) සෘජු නිෂ්පාදනයේ වර්ධනය සමඟ මුදල් භාවිතයට පැමිණීම සිදු විය.
(5) භාණ්ඩ හුවමාරු අදියරේදී විද්‍යුත් වාණිජ්‍ය භාවිතයට පැමිණීම සිදු විය. (.....)

03. පහත දැක්වෙන්නේ ව්‍යාපාර පිළිබඳ උනන්දුවන පාර්ශව කිහිපයක් හා උනන්දු වීමට හේතු කිහිපයකි.

පාර්ශව	**උනන්දුවීමට හේතු**
(1) අයිතිකරුවෝ	A. ව්‍යාපාරයේ වර්ධනය දැන ගැනීමට
(2) කළමණාකරුවෝ	B. රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට
(3) සේවකයෝ	C. තම ණය මුදලේ සුරක්ෂිතබව දැන ගැනීමට
(4) ණය හිමියෝ	D. ලාභය උපරිම කිරීමට

Past Papers Wiki

ඉහත පාර්ශව හා උනන්දුවීමට හේතු වඩාත් නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

(1) D,A,B,C (2) C,A,B,D (3) D,B,A,C

(4) A,D,B,C (5) C,D,B,A (.....)

04. ව්‍යාපාරයක් එහි ගනුදෙනුකරුවන්ට ආචාරධර්ම ඉටු කිරීම සඳහා කළ යුතු වන්නේ,

(1) ව්‍යාපාරයේ මූල්‍ය අක්‍රමිකතා හා වංචා පිටු දැකීමය.

(2) සාධාරණව තරඟකාරීත්වයට මුහුණ දීමටය.

(3) ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීමටය.

(4) සේවක අයිතීන් සුරකීම

(5) නව වෙළෙඳපොළවල් කරා භාණ්ඩ යොමු කිරීම. (.....)

05. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බදු වර්ග කිහිපයකි.

A – පුද්ගල ආදායම් බදු B – එකතු කළ අගය මත බදු

C – රඳවා ගැනීමේ බදු D – ප්‍රාග්ධන ලාභ මත බදු

E – රේගු බදු F – සමාගම් බදු

G – නිෂ්පාදන බදු

ඉහත බදු වර්ග අතුරින් සෘජු බදු පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) A,B,D,F (2) B,D,F,G (3) A,C,D,F

(4) B,C,F,G (5) C,D,E,F (.....)

06. පහත දැක්වෙන්නේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති ප්‍රකාශ දෙකකි.

A – 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධාන මත පමණක් හවුල් ව්‍යාපාරය පවත්වා ගත යුතුය.

B – හවුල් ඔප්පුවක හවුල් ව්‍යාපාරය සම්බන්ධ මූලික තොරතුරු ඇතුළත් වේ.

ඉහත තොරතුරු සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A පමණක් නිවැරදිය

(2) B පමණක් නිවැරදිය

(3) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය.

(4) A හා B ප්‍රකාශ දෙකම වැරදිය.

(5) A ප්‍රකාශය මඟින් B ප්‍රකාශය පැහැදිලි කරයි. (.....)

07. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන පිළිබඳ ප්‍රකාශ කිහිපයක් වේ.

A – අයිතිකරු විසින් පාලනය කරයි.

B – ඡන්දයෙන් පත් වූ අධ්‍යක්ෂවරු විසින් පාලනය කරයි.

C – ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනයක් පවතී.

D – රජය පත්කරන අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් පාලනය කරයි.

E – අමාත්‍යාංශයේ සෘජු පාලනයට යටත්වේ.

ඉහත ප්‍රකාශ සඳහා ගැලපෙන ආයතන නිවැරදිව පෙළගස්වා ඇති පිළිතුර වන්නේ,

(1) සමූපකාර, සංස්ථාපිත සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා

(2) කේවල ස්වාමි ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා

(3) කේවල ස්වාමි ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමුපකාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු

(4) සංස්ථාපිත සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, සමුපකාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු

(5) සංස්ථාපිත සමාගම්, සමුපකාර, කේවල ස්වාමි ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු

(.....)

08. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර නිවැරදිව දැක්වෙන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(1) සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → නව්‍යතා සොයා ගැනීම → සම්පත් සම්පාදනය → ප්‍රතිලාභ ලැබීම → යථාර්ථයක් බවට පත් කිරීම.

(2) සම්පත් සම්පාදනය → සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → නව්‍යතා සොයා ගැනීම → ප්‍රතිලාභ ලැබීම → යථාර්ථයක් බවට පත් කිරීම.

(3) සම්පත් සම්පාදය → සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → ප්‍රතිලාභ ලැබීම → යථාර්ථයක් බවට පත් කිරීම → නවෝත්පාදනය

(4) නව්‍යතා සොයා ගැනීම → සම්පත් සම්පාදනය → සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → යථාර්ථයක් බවට පත් කිරීම → ප්‍රතිලාභ ලැබීම

(5) නව්‍යතා සොයා ගැනීම → සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම → අවශ්‍ය සම්පත් සම්පාදනය → යථාර්ථයක් බවට පත් කර ගැනීම → ප්‍රතිලාභ ලැබීම. (.....)

09. පහත දැක්වෙන්නේ විශේෂිත මූල්‍ය ආයතන වල කාර්යයන් කිහිපයක් හා ඊට සම්බන්ධ පාර්ශව කිහිපයකි.

කාර්යය	**පාර්ශවය**
A. වෙළෙඳ ආයතන ගනුදෙනුකරුවන්ට සැපයූ ණය අය කිරීම සහ මිලදී ගැනීම සිදු කරයි.	1. ප්‍රාථමික අලෙවිකරුවන්
B. නව ව්‍යවසායකයින්ට අවශ්‍ය ප්‍රාග්ධන සපයයි.	2. ප්‍රාරක්ෂකයින්
C. සමාගම මහජනයාට කරන සුරකුම් නිකුතුවකදී අලෙවි නොවූ සුරකුම් මිලට ගැනීමට ගිවිස ගනී.	3. ආන්තික සැපයුම්කරුවන්
D. රජයේ සුරකුම් මිලට ගෙන ද්විතික වෙළෙඳපොළේ අලෙවි කරයි.	4. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

ආයතන වල කාර්යය හා පාර්ශව නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

(1) A3, B2, C4, D1 (2) A2, B4, C1, D3 (3) A4, B3, C2, D1

(4) A1, B4, C2, D3 (5) A3, B4, C2, D1 (.....)

10. පහත දැක්වෙන්නේ බැංකු ගිණුම් පිළිබඳ ඉදිරිපත් වී ඇති ප්‍රකාශ කිහිපයකි.

A – ජංගම ගිණුම් පවත්වාගෙන යයි.
B – බැංකු ප්‍රකාශයක් ලබයි.
C – සමාගම් කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කරයි.
D – ස්ථාවර තැන්පතු පවත්වාගෙන යයි.
E – ඉතුරුම් තැන්පතු පවත්වාගෙන යයි.
F – කල්බදු පහසුකම් සපයයි.
G – අයිරා පහසුකම් සපයයි.

ඉහත ප්‍රකාශ අතුරින් බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවල කාර්යය පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, C, D
(2) A, C, D, E
(3) C, D, E, F
(4) B, C, F, G
(5) D, E, F, G
(……)

11. තේ කර්මාන්ත ශාලාවක් සඳහා ගිනි හා සොරබිය රක්ෂණාවරණයක් ලබා ගැනීමේ අරමුණ වන්නේ,

(1) අවදානම වැඩි කර ගැනීමය.
(2) අවදානම අවම කර ගැනීමය.
(3) අවදානම භාර ගැනීමය.
(4) අවදානම විතැන් කිරීමය.
(5) අවදානම පාලනය කිරීමය.
(…….)

12. නුවරඑළිය ප්‍රදේශයේ සිට දුම්රිය මාර්ග හරහා විශේෂිතව සැකසූ දුම්රිය මැදිරි සහිත දුම්රිය යොදාගෙන කොළඹට මල් ප්‍රවාහනය කිරීමට නියමිත වුවත් ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය හේතුවෙන් ඇති වූ කාර්මික දෝෂයක් නිසා දුම්රිය ස්ථානය වෙත පැමිණීම ප්‍රමාද විය.

ඉහත සිද්ධියට අනුව ප්‍රවාහනයේ මූලිකාංග පිලිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) මාර්ගය, බලය, මාධ්‍යය, පර්යන්තය
(2) මාර්ගය, මාධ්‍යය, බලය, පර්යන්තය
(3) පර්යන්තය, මාධ්‍යය, බලය, මාර්ගය
(4) මාධ්‍යය, මාර්ගය, පර්යන්තය, බලය
(5) බලය, මාර්ගය, මාධ්‍යය, පර්යන්තය
(…….)

13. පහත දැක්වෙන්නේ සන්නිවේදන ආකාර කිහිපයකි.

A – අණ බෙර
B – E – mail
C – දැන්වීම් පුවරු
D – SMS සේවාව
E – නිවේදන පොත
F – දුරකථන
G – ශබ්ද විකාශන යන්ත්‍ර
H– Whatsapp පණිවුඩ

ඉහත සන්නිවේදන ආකාර අතරින් පණිවුඩය යවන්නාට,පණිවුඩය යැවූ බවට සාක්ෂිලෙස තබා ගත හැකි සන්නිවේදන ආකාර ඇතුළත් වරණය වන්නේ,

(1) A, C, F, G
(2) A, B, C, D
(3) E, D, F, H
(4) B, D, E, H
(5) D, E, F, G
(……)

14. ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින්ම සිදු කරනු ලබන නියෝජිතයා වන්නේ,

(1) සාධ්‍යකයා
(2) කොමිස් නියෝජිතයා
(3) කැපකාර නියෝජිතයා
(4) තැරැව්කරුවා
(5) වෙන්දේසිකරුවා
(…….)

15. පහත දැක්වෙන්නේ විදේශ වෙළෙඳාමේ ප්‍රභේද කිහිපයක් හා ඒ සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

1. ආනයන වෙළෙඳාම	A. යම් රටකින් ගෙන්වන ලද ද්‍රව්‍ය රටතුලට ගෙන වෙනසකට ලක් කර හෝ නොකර නැවත යැවීම.
2. අපනයන වෙළෙඳාම	B. යම් රටක් තවත් රටකින් හෝ රටවලින් භාණ්ඩ ගෙන්වීම.
3. ප්‍රති අපනයන වෙළෙඳාම	C. යම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ යැවීම.
4. අන්තරාල වෙළෙඳාම	D. විදේශයන්ගෙන් ගෙන්වන ද්‍රව්‍ය රටතුලට නොගෙන වරාය තුළ සකසා හෝ සැකසීමකින් තොරව නැවත රටවලට යැවීම.

එම වෙළෙඳ ප්‍රභේද හා අදාළ කරුණු නිවැරදිව ගැලපූ පසු පිළිතුර වන්නේ,

(1) B, C, A, D (2) B, C, D, A (3) C, A, D, B

(4) C, B, D, A (5) A, D, C, B (……)

16. ඊයේ දිනට ඇමරිකානු ඩොලරයක විකුණුම් මිල රු.338.93 ක එහි ගැනුම් මිල රු.337.85 කි. එය අද දිනට විකුණුම් මිල රු. රු.339.93 කි. එහි ගැණුම් මිල රු.338.73 කි. මේ හේතුවෙන්,

(1) ආනයනික භාණ්ඩ ඇණවුම් වැඩි වෙ. (2) අපනයන භාණ්ඩ ඇණවුම් වැඩි වේ.

(3) අපනයන මිළ වැඩි වේ. (4) ආනයන භාණ්ඩ මිල අඩුවේ.

(5) අපනයන අඩු වේ. (…….)

17. භාණ්ඩයක ගුණත්ව අංගෝපාංගයකි.

(1) ශූන්‍ය දෝෂ (2) ගුණත්ව ප්‍රමිති (3) මනා ක්‍රියාකාරිත්වය

(4) තත්ත්ව කව (5) තත්ත්ව පාලනය (…….)

18. ඛණිජ තෙල් අර්බුධය නිසා හැකි සෑම පාරිභෝගිකයෙක්ම තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා මංගත ක්‍රමයට ඇණවුම් කර ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස රජය මහජනයාගෙන් ඉල්ලා සිටී.

මෙයින් අදහස් වන්නේ,

(1) මහජනයා නව තාක්ෂණයට අනුගත විය යුතු බවයි.

(2) මංගත වෙළඳාම දියුණු කළ යුතු බවයි.

(3) සැලසුම් සහගතව වැඩ කළ යුතු බවයි.

(4) වෙනස්වන පරිසරයට අනුගත විය යුතු බවයි.

(5) රජය මැදිහත් විය යුතු බවයි. (…….)

PAST PAPERS WIKI

19. නිෂ්පාදන ක්‍රම හා එයින් කෙරෙන කාර්ය කිහිපයක් පහතින් දී ඇත.

නිෂ්පාදන ක්‍රමය	**කාර්යය**
a) පරිගණක ආධාරක නිර්මාණකරණය	**1.** නිර්මාණ ශිල්පියා විසින් අදාළ පරිගණක වැඩසටහන ඇසුරින් මෝස්තර සකසයි.
b) පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය	**2.** නිෂ්පාදනාගාරයේ යන්ත්‍රවල ක්‍රියාකාරිතවය පරිගණක මගින් පාලනය කිරීම සිදු වේ.
c) පරිගණක සමෝධානිත නිෂ්පාදනය	**3.** තනි පුද්ගලයෙකුට වුවද කර්මාන්ත ශාලාවක් නියාමනය කළ හැකිය.
d) පරිගණක අංකිත පාලනය	**4.** නිතර නිතර කළ යුතු දෘඩ කාර්යයන් සඳහා ද ඉතා සියුම් නිෂ්පාදන කාර්යයන් සඳහාද යොදා ගනී.

දී ඇති නිෂ්පාදන ක්‍රමය අනුව කාර්යය ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) a1, b2, c3, d4 (2) a1, b3, c2, d4 (3) a1, b4, c3, d2

(4) a1, b3, c4, d2 (5) a1, b4, c2, d3 (……)

20.

භාණ්ඩ වර්ගය	**නිදසුන්**
A. සාප්පු භාණ්ඩ	1. මෝටර් රථ, ස්වර්ණාභරණ
B. පාරිභෝගික භාණ්ඩ	2. අලුත් පොත්, විශේෂිත රෝග සඳහා ඖෂධ
C. විශේෂිත භාණ්ඩ	3. වාහන නිෂ්පාදිත උපාංග, යන්ත්‍ර සූත්‍ර
D. නොසෙවූ භාණ්ඩ	4. විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ
E. කාර්මික භාණ්ඩ	5. පුවත්පත්, සහල්

භාණ්ඩ වර්ගය සඳහා නිදසුන් නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) A1, B2, C3, D4, E5 (2) A4, B5, C3, D1, E2 (3) A4, B5, C1, D2, E3

(4) A1, B3, C4, D2 ,E5 (5) A1, B2, C4, D3, E5 (…….)

21. ජංගම දුරකථනයක් ඇත්තේ පණිවුඩ හුවමාරු කර ගැනීමටය. එය යම් අවස්ථාවක නාද වන විට හිමිකරු වෙත ආකර්ශනය වන සේ නිපදවීමට හැකිවන්නේ නම් එය භාවිතාකරන්නාට වඩාත් පහසුවේ. මෙහි ඇතුළත් වන්නේ නිෂ්පාදිතයක කුමන මට්ටම පිළිබඳවද?

(1) අපේක්ෂිත නිෂ්පාදිතය හා වැඩි දියුණු කළ නිෂ්පාදිතය

(2) විභව නිෂ්පාදිතය හා අපේක්ෂිත නිෂ්පාදිතය

(3) හර ප්‍රතිලාභය හා අපේක්ෂිත නිෂ්පාදිතය

(4) වැඩි දියුණු කළ නිෂ්පාදිතය හා මූලික නිෂ්පාදිතය

(5) හර ප්‍රතිලාභය හා විභව නිෂ්පාදිතය (…….)

22. සිලෝන් මිල්ක් සමාගම තම කිරිපිටි සුළං නොවදින සේ පොලියුරතීන් කවර වල බහා හොඳින් සීල්කර පෙට්ටි වල බහා පෙට්ටි 100ක් දැමිය හැකි විශාල පෙට්ටි වල අසුරා ලොරි රථ වලින් රට පුරා බෙදා හරියි. මෙම විස්තරයේ ඇතුළත් තොරතුරු වලින් වඩාත් පැහැදිලි වන්නේ,

(1) ඇසුරුමේ යෝග්‍යතාව පිළිබඳවයි.

(2) නිෂ්පාදිතයේ ස්වාභාවය පිළිබඳවයි.

(3) ඇසුරුමෙන් වෙළෙන්දාට පහසුවක් වන බවයි.

(4) ඇසුරුම් වර්ග කීපයක් ඇති බවයි.

(5) ඇසුරුමේ අංග පිළිබඳවයි. (.....)

23. ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා දේශීය වශයෙන් අරමුදල් යොදා ගැනීමට රජය බලාපොරොත්තු වන්නේ නම් ඊට අරමුදල් සපයා ගත හැකි මූල්‍ය වෙළඳපොළ වන්නේ,

(1) අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළයි. (2) දේශීය විදේශීය විනිමය වෙළඳපොළයි.

(3) භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළයි. (4) භාණ්ඩාගාර බැදුම්කර වෙළඳපොළයි.

(5) සාංගමික බැදුම්කර වෙළඳපොළයි. (.....)

24. S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය අනුව සමාගම් 20 තෝරාගැනීමේ දී සළකා බලන සාධකයක් වන්නේ,

(1) සමාගමේ ප්‍රාග්ධනය (2) සමාගමේ දවශීලතාවය (3) සමාගමේ පාලන ව්‍යුහය

(4) සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය (5) සමාගමේ ණය ප්‍රාග්ධනය (.....)

25. පහත වගුවේ අයදුම්කරුවන් තෝරා ගැනීමේ ක්‍රම සහ එමගින් මැනිය හැකි ගුණාංග පිළිබඳව සඳහන් වේ.

ක්‍රමය	**මැනිය හැකි ගුණාංග**
I. බුද්ධි පරීක්ෂණ	A. කාර්ය ඉටු කිරීමේ හැකියාව
II. සම්මුඛ පරීක්ෂණ	B. චරිතවත් බව
III. පසුබිම් පරීක්ෂණ	C. තනතුරට අදාළ කුසලතා සපුරා ඇති බව
IV. ප්‍රායෝගික පරීක්ෂණ	D. තර්කානුකූල බව
V. අයදුම්පත් ඇගයීම්	E. අදහස් හුවමාරුවෙන් රැකියාවට ගැලපෙන බව

(1) I D, II E, III B, IV A, V C (2) I D, II E, III C, IV B, V A

(3) I E, II D, III B, IV A, V C (4) I D, II E, III A, IV B, V C

(5) I A, II B, III C, IV D, V E (.....)

26. කාර්යඵල ඇගයීමෙන් සේවාදායකයාට,

(1) සංවේතන තීරණය කළ හැකිය. (2) සේවක උසස් වීම් තීරණය කළ හැකිය.

(3) මාරු කිරීම් පිළිබඳ තීරණය කළ හැකිය. (4) ඉපයීම් ඉහළ නංවා ගැනීමට හැකිය.

(5) පුහුණු කිරීමේ අවශ්‍යතා හඳුනා ගත හැකිය. (.....)

27. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයෙකුගේ වැටුපෙන් අයකර ගන්නා ප්‍රතිශතය,

(1) 20% (2) 10% (3) 12% (4) 8% (5) 3% (.....)

28. පහත සඳහන් වන්නේ ව්‍යාපාර කාර්යයන් කීපයකි.

a – වෙළඳපොළ පර්යේෂණ

b – යන්ත්‍රෝපකරණ පාලනය

c – නිෂ්පාදිත සංවර්ධනය

d – විගණනය

e – කාර්යඵල ඇගයීම

ඉහත කාර්යයන් කළමණාකරන ශ්‍රිතය අනුව තොරතුරු පද්ධතිවලට වර්ග කළ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) මෙහෙයුම්, මූල්‍ය, අලෙවිකරණ, මානව සම්පත්, පර්යේෂණ හා සංවර්ධන

(2) අලෙවිකරණ, මූල්‍ය, මානව සම්පත්, පර්යේෂණ හා සංවර්ධන, මෙහෙයුම්

(3) අලෙවිකරණ, මෙහෙයුම්, පර්යේෂණ සංවර්ධන, මූල්‍ය, මානව සම්පත්,

(4) මූල්‍ය, මෙහෙයුම්, අලෙවිකරණ, පර්යේෂණ හා සංවර්ධන, මානව සම්පත්

(5) මෙහෙයුම්, මූල්‍ය, පර්යේෂණ හා සංවර්ධන, මානව සම්පත්, අලෙවිකරණ (.....)

29. රාජ්‍ය ආයතනයක් පිළිබඳ තොරතුරක් ලබා ගැනීමට යම් පුද්ගලයෙකුට ඇමතුට හැකි දුරකථන අංකයක් වන්නේ,

(1) 1990 (2) 1919 (3) 199 (4) 1929 (5) 1926 (.....)

30. සමාගමක තෝලන අනුපාතයෙන් පෙන්නුම් කරන්නේ,

(1) වත්කම් හා විකුණුම් අතර අනුපාතයයි.

(2) වත්කම් හා වගකීම් අතර අනුපාතයයි.

(3) ප්‍රාග්ධනය හා වත්කම් අතර අනුපාතයයි.

(4) මුළු ප්‍රාග්ධනය හා මුළු වගකීම් අතර අනුපාතයයි.

(5) මුළු ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර අනුපාතයයි. (.....)

අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචනය/ වචන යොදා හිස්තැන් පුරවන්න.

---

31. (අ) ව්‍යාපාරයක සැලසුම් සැකසීම හා තීරණ ගැනීම ..... විසින් කරනු ලබන අතර එම සැලසුම් හා තීරණ අනුව කාර්යයන්හී නිරත වීම ..... විසින් සිදු කරයි.

(ආ) රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරු වීමට ..... බලපා ඇති අතර එයින් පුද්ගලයින්ගේ ..... ද වෙනසකට ලක් ව ඇත.

32. (අ) මෑතකදී ශ්‍රී ලංකා මහා බැංකුව මෙතෙක් පැවති ද්විත්ව පොලි අනුපාතික ක්‍රමවේදයේ සිට ..... ප්‍රතිපත්තිමය පොළී අනුපාතයකට යොමු වූ අතර එම උපකරණය ..... පොලි අනුපාතිකය ලෙස හඳුන්වා දෙන ලදී.

(ආ) රජයේ ආදායම ..... හා ..... ආදායම ලෙස වර්ග කළ හැක.

33. (අ) සීමිත පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව ..... ක් වන අතර සීමිත පොදු සමාගමක අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව ..... ක් වේ.

(ආ) වෙන්වෙන්ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පත් වීම ..... වන අතර එක් සමාගමක් අනෙක් සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම ..... කර ගැනීම වේ.

34. (අ) කොටස් වෙළෙඳපොළේ සුරකුම්පත් වල ..... තුළින් සෘජු හා වක්‍ර ..... ලැබේ.

(ආ) සමාගම සතුව පවතින ..... ප්‍රාග්ධනය බවට පත් කිරීම සංචිත ..... වේ.

35. (අ) වෘත්තීය ආරවුලක් සම්බන්ධව ..... දෙපාර්ශවය අතර සාමූහිකව ..... ඇති වේ.

(ආ) විද්‍යුත් යතුරු ලියනය ..... දත්ත සැකසුම් උපකරණයක් වන අතර විද්‍යුත් .....දත්ත සැකසීමේ තාක්ෂණික ක්‍රමයකි.

36. (අ) කිසියම් විශේෂිත විෂයය ක්ෂේත්‍රයකට අදාළව .....කිරීමට කළමනාකරුවෙකුට ඇති හැකියාව ..... කුසලතා ලෙස හඳුන්වන අතර

(ආ) ..... කටයුතු සමඟ සම්බන්ධවන නිසා ..... මේවා වැඩි වශයෙන් අවශ්‍ය වේ.

37. (අ) ආයතනයක වැඩකටයුතු සිදුවන ..... විචලනයන් .....ක්‍රියාමාර්ග ගැනීම.

(ආ) ..... ලෙස එය හඳුන්වන අතර .....දී එය සිදු වේ.

38. (අ) සංවිධානයන්හි කාර්යය ඉටු කිරීමට අවශ්‍ය ..... ලබා දීම සම්පත් ..... යනුවෙන් අදහස් වේ.

(ආ) වෙන් වූ වැඩ ඒකකවල කාර්ය හා අරමුණු ..... කිරීමේ ක්‍රියාවලිය ..... නම් වේ.

39. (අ) භාණ්ඩයකට ..... ලබාදීම සඳහා ..... යොදනු ලබයි.

(ආ) භාණ්ඩයක් හෝ සේවාවක් ..... මගින් පාරිභෝගිකයා ලබන ..... වෙනුවෙන් හුවමාරු කිරීමට කැමති වටිනාකම මිල ලෙස හඳුන්වයි.

40. (අ) ස්වාභාවය අනුව තොරතුරු ..... හා ..... ලෙස වර්ග කළ හැකිය.

(ආ) .....පද්ධතියක් මගින් දත්ත තොරතුරු බවට පත් කෙරේ. මෙය ..... කි.

අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු දී ඇති හිස්තැන් මත ලියන්න.

41. තොරතුරු තාක්ෂණයේ දියුණුව සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රවණතා හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

42. පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරනු ලබන ආයතන හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

43. 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සමාගමක් ලියාපදිංචියට ඉදිරිපත් කළ යුතු ලියවිලි හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

44. විද්‍යුත් මුදල් කාඩ්පත් මගින් ගනුදෙනු කිරීමට යොදා ගනු ලබන පහසුකම් හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

45. නිදහස් වෙළෙඳාමට බලපාන තීරු බදු නොවන බාධා හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

46. ගබඩාවක තොගය අවම තොග මට්ටමට වඩා පහළ ගියහොත් ව්‍යාපාරයකට අත්විඳීමට සිදු වන ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

47. හොඳ සන්නමක පැවතිය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

48. වැඩ වර්ජන නිසා ආර්ථිකයට වන අහිතකර බලපෑම් හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

49. තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

50. මානව සම්පත් සැලසුමක ඇතුළත් විය යුතු කරුණු හතරක් ලියන්න.

(1) .....

(2) .....

(3) .....

(4) .....

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2026 - 13 ශ්‍රේණිය
Final Term Test – 2026 – Grade 13

ව්‍යාපාර අධ්‍යයනය - II **Business Studies - II**	**32 S II**	කාලය / *Time* — පැය තුනයි / *Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
Additional Reading Time - 10 Minutes

උපදෙස් :

- එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන,අවම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. කමල් විසින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කරන ආයතනයක් කේ.එච්.ෆර්නිචස් නමින් මොරටුව ප්‍රදේශයේ පවත්වාගෙන යන අතර දිවයින පුරා ශාඛා දහයක පමණ ඔහුගේ නිෂ්පාදන අලෙවි කරයි. මෙම ව්‍යාපාර ආයතනය සඳහා පක්ෂපාති ගනුදෙනුකරුවන් පිරිසක් ද සිටින අතර දක්ෂ සේවකයන් පන්සීයක් පමණ සේවය කරයි. මෙම ව්‍යාපාරය නවීන මාදිලියේ සුඛෝපබෝගී ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන අතර නිෂ්පාදන සඳහා වගකීම් සහතික ලබා දීමත් අදාළ ස්ථානයට ප්‍රවාහනය කර දීමත් සිදු කරයි. එසේම විදේශයන්ගෙන් නවීන ගෘහ භාණ්ඩ ආනයනය කර ඔහුගේ ප්‍රදර්ශනාගාර තුළ අලෙවිකිරීම කරනු ලැබුවත් ගෝලීය යුධ වාතාවරණය හේතුවෙන් එම භාණ්ඩ ආනයනය මෙන්ම මිල කිරීමේ ගැටලුද මතුවිය.

i. (අ) කමල්ගේ ව්‍යාපාර ආයතනය මගින් සපුරාලන්නේ මිනිස් අවශ්‍යතාවකි. ඔබ එකඟ වන්නේද? පිළිතුරට හේතුව ලියන්න. (ල.2)

(ආ) පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීම සඳහා කමල් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල.2)

ii. කමල්ගේ ව්‍යාපාරය පහත නිර්ණායක මත වර්ග කර දක්වා ඊට හේතුව පැහැදිලි කරන්න.

(අ) පරිමාණය අනුව (ල.2)

(ආ) හිමිකම අනුව (ල.2)

iii. (අ) ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු දෙක නම් කර සිද්ධිය ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

(ආ) ඉහත ව්‍යාපාරයේ අවස්ථාවක් හා තර්ජනයක් ලියන්න. (ල.2)

iv. (අ) ඉහත ව්‍යාපාරය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ආසන්න හා සාර්ව පරිසර සාධක දෙක බැගින් ලියන්න. (ල.2)

(ආ) කමල්ගේ ව්‍යාපාරය හරහා සමාජයට ඉටුකළ යුතු සමාජ වගකීම් හතරක් ලියන්න. (ල.2)

v. (අ) මෙම ව්‍යාපාර ආයතනයට පාරිසරික තිරසර බව තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල.2)

(ආ) මෙම ව්‍යාපාර ආයතනය ආර්ථිකය සංවර්ධනයට දායක වන ආකාර දෙකක් සිද්ධිය ඇසුරින් දක්වන්න. (ල.2)

02. මායා ඇපරල් නමින් මාලනී විසින් සේවකයන් දස දෙනෙකු යොදා ගෙන ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යයි. නිෂ්පාදිත දේශීය වෙළෙඳ පොළට සපයයි. ඇය විසින් ව්‍යාපාරය පුළුල් කිරීමේ අරමුණින් සීමිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමට අපේක්ෂා කරයි.

i. (අ) මාලනීට රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට දායක විය හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ල.2)

(ආ) ඇයට දිරි ගැන්වීම් ලබා ගත හැකි රාජ්‍ය ආයතන හතරක් නම් කරන්න. (ල.2)

ii. (අ) මාලනීගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? පිළිතුරට හේතු ලියන්න. (ල.2)

(ආ) ඇයගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය ලියන්න. (ල.2)

iii. (අ) මෙම ව්‍යාපාරය ඒක පුද්ගල ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමෙන් අත්වන ප්‍රතිලාභ හතරක් ලියන්න. (ල.2)

(ආ) "මායා ඇපරල්"ආයතනය සීමිත සමාගමකින් වෙනස් වන ආකාරය කරුණු හතරක් ඇසුරින් ලියන්න. (ල.2)

iv. (අ) වරලත් ගිවසුමක් යන්න අර්ථ දක්වා එහි ඇතුළත් කරුණු හතරක් ලියන්න. (ල.2)

(ආ) වරලත් ව්‍යාපාර ක්‍රමය මගින් වරලත් හිමියාට අත්වන වාසි දෙකක් හා සීමා දෙකක් සඳහන් කරන්න. (ල.2)

v. (අ) රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ හතරක් ලියන්න (ල.2)

(ආ) ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය නව ආයතන හතරක් යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම මෑතකදී රජය ගත් ක්‍රියාමාර්ගයකි. (ල.2)

රජය එසේ සිදු කිරීමෙන් ඉටු කිරීමට අපේක්ෂා කරනුයේ කුමක්දැයි කරුණු දෙකක් ඇසුරින් දක්වන්න. (ල.2)

03. i. (අ) ගෝලීය ව්‍යවසායකත්වය යන්න හඳුන්වන්න. (ල.2)

(ආ) ගෝලීය ව්‍යවසායකත්වයට එරෙහිව ඇති අභියෝග දෙකක් දක්වන්න. (ල.2)

ii. චමිත් සිය රැකියාවෙන් ලද ජුනි මස වැටුපෙන් රු.60,000ක් යොදවා ජංගම දුරකථනයක් මිලදී ගැනීමත් රු.10,000 ක් යොදවා බැංකු ණය වාරිකය ගෙවීමත් රු.16,000 ක් යොදවා නිවසේ කුලිය ගෙවීමත් රු.10,000 ක් බැංකුවේ තැන්පත් කිරීමක් සිදු කරන ලදී.

(අ) මුදලේ කාර්යයන් දෙකක් නම් කර සිද්ධිය ඇසුරින් උදාහරණ ලියන්න. (ල.2)

(ආ) ඉහත සිද්ධිය ඇසුරින් හඳුනා ගත හැකි මුදල් වර්ග දෙකක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

iii. (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍ර ලාභී මුදල් සමාගම් අතර වෙනස් කම් දෙකක් ලියන්න. (ල.2)

(ආ) කොටස් තැරැව්කාර සමාගම් වල කාර්යයන් හතරක් ලියන්න. (ල.2)

iv. දැහැමි සේනානායක යන අයට රු.15000 ක මුදලක් ගෙවීම සඳහා චෙක්පතක් ලිවිය යුතුව ඇත. ඇයගේ බැංකු ගිණුම රත්නපුර මහජන බැංකු නගර ශාඛාවේ පවතී.

(අ) ඉහත චෙක්පත ලිවීමේදී අනුගමනය කළ හැකි ආරක්ෂිත ක්‍රමවේද හතරන් ලියන්න. (ල.2)

(ආ) චෙක්පතක් පිටසන් කිරීම යන්න හඳුන්වා පිටසන් කළ යුතු අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ල.2)

v. ලක්මාල් හට හිමිකාරීත්වය ඇති නුවරඑළියේ පිහිටි තේ කර්මාන්ත ශාලාව රුපියල් ලක්ෂ දහය බැගින් ආයතන හතරක රක්ෂණය කර ඇතත් කර්මාන්තශාලාවට සිදුවූ රු.ලක්ෂ පහක හානිය සඳහා ආයතන හතරෙන්ම ලද වන්දි මුදල රුපියල් ලක්ෂ පහකි.

(අ) ඉහත සිද්ධියට අදාලවන රක්ෂණ මූලධර්මය දක්වා වන්දි හිමිවීමට බලපෑ හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

(ආ) ලක්මාල් හට ලබා ගත හැකි වෙනත් රක්ෂණ ඔප්පු හා එම රක්ෂණාවරණ ලබා ගත හැකි අවස්ථා හතරක් දක්වන්න. (ල.2)

04. i. ආයතනය සේවකයින් සඳහා පවත්වනු ලබන එක්දින ධාරිතා සංවර්ධන වැඩ සටහන සඳහා 2026 අගෝස්තු මස 05 වන දින තම අංශවල සියලු සේවකයින් සහභාගී කරවන ලෙස සියලු කළමනාකරුවන්ට ප්‍රධාන විධායක නිළධාරී විසින් ලිපියක් මඟින් දැනුම් දෙන ලදී. ඒ සඳහා අදාළ කටයුතු සුදානම් කළ බව කළමණාකරුවන් විසින් ලිපියකින් ප්‍රධාන විධායක නිළධාරී වෙත දැනුම් දෙන ලදී.

ඉහත සිද්ධිය ඇසුරින් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නම් කර උදාහරණ ලියන්න. (ල.4)

ii. නිසි කලට ප්‍රවාහනය වෙළෙඳාමේ ව්‍යාප්තියටත් පුද්ගලයින්ගේ පැවැත්මටත් ඉවහල් වේ.

(අ) ප්‍රවාහනය ව්‍යාපාරු- සඳහා හා ආර්ථිකයට වැදගත්වන ආකාර දෙක බැගින් ලියන්න. (ල.2)

(ආ) ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න. (ල.2)

iii. (අ) ප්‍රවාහන හා සැපයුම් සේවාවල ප්‍රයෝජන හතරක් ලියන්න. (ල.2)

(ආ) ගෝලීය රටවල පවතින යුධමය තත්ත්වය ව්‍යාපාර ක්ෂේත්‍රයට ඇති කරනු ලබන බලපෑම ප්‍රබලය. එය කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

iv. ගේලීය වශයෙන් රටවල් විදේශ වෙළෙඳාමෙ නියැලීම අත්‍යවශ්‍ය කරුණකි.

(අ) විදේශ වෙළෙඳාමට පදනම් වී ඇති සාධක හතරක් ලියන්න. (ල.2)

(ආ) ණයවර ලිපිය විදේශ වෙළෙඳාම සඳහා වැදගත් වන්නේ කෙසේදැයි ලියන්න. (ල.2)

v. (අ) විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා හතරක් ලියන්න. (ල.2)

(ආ) විද්‍යුත් වෙළෙඳාම මඟින් ව්‍යාපාරිකයින්ට හා ගනුදෙනුකරුවන්ට අත්වන වාසි දෙක බැගින් ලියන්න. (ල.2)

II කොටස

05. i. කළමනාකරණය යනු ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ, අරමුණු සඵලදායීව ඉටුකර ගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්‍යක්ෂමතාවයෙන් යුතුව සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය යන කාර්යය ඇතුළත් සඵලදායි ක්‍රියාවලියකි.

(අ) මෙම නිර්වචනය තුළ ඇතුළත් සංකල්ප හතරක් පැහැදිලි කරන්න. (ල.2)

(ආ) සංවිධානවල පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා කළමනාකරණය වැදගත්වන ආකාර දෙකක් දක්වන්න. (ල.2)

ii. විදුහල්පතිතුමා ගුරු රැස්වීම අමතන අවස්ථාවේ දැනුම් දුන් පරිදී වර්ෂ අවසාන ත්‍යාග ප්‍රධානොත්සවයේදී සිසුන්ට සහතික පත් බෙදා දීම ඔහු විසින්ම කරන බව දැන්විය. ඒ සඳහා තමා ලවා කලින්ම සහතිකපත් අත්සන් කරගන්නා ලෙස ගුරුවරුන්ට දන්වන ලදී. තවද ත්‍යාග ප්‍රධානෝත්සවයට අමුත්තන් පිළිගැනීම ප්‍රධාන දොරටුව අභියසදී තමා විසින් සිදු කරන බවත් එම නිසා පිළිගැනීමේ තොරණ එම ස්ථානයේ සවි කරන ලෙසත් සංවිධායක මණ්ඩලයට දන්වන ලදී. රැස්වීමෙදී පසුගිය වර්ෂයේ ප්‍රගතිය මත ඉදිරි වැඩ සැලසුම් කිරීම පිළිබඳව විදුහල්පතිතුමා විසින් මූලිකත්වය දෙන ලදී. තවද පාසලේ ලී බඩු උපකරණ හිඟයට පිළියම් ලෙස කැඩුණු ලී බඩු අලුත්වැඩියා කරවීමට ද ගුරුවරු කණ්ඩායමකට පවරන ලදී.
මෙම සිද්ධියේ ඇතුළත් කළමනාකරණ භූමිකා දෙකක් හා උප භූමිකා දෙකක් නිදසුන් සහිතව දක්වන්න. (ල.4)

iii. (අ) සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන ක්‍රියාකරකම් දෙකක් නම් කර පැහැදිලි කරන්න. (ල.2)

(ආ) මෙහෙවර ප්‍රකාශයකින් පිළිතුරු සපයන්නේ සංවිධානයේ කුමන ප්‍රශ්න වලටද? (ල.2)

iv. ව්‍යාපාරිකයෙකු වූ සුනෙත්ගේ අරමුණ වන්නේ කෙසේ හෝ නිෂ්පාදනය වැඩි කරගනිමින් කාර්යය සාර්ථක කර ගැනීමයි.

(අ) ඔහුගේ නායකත්ව ශෛලිය වන්නේ කුමක්ද? (ල.2)

(ආ) සාර්ථක නායකයෙකු තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග හතරක් දක්වන්න. (ල.2)

v. සේවකයන් වැඩට පොළඹවා ගැනීමට විවිධ අභිප්‍රේරණ ක්‍රම යොදා ගැනීම වර්ථමානයේ බහුලව දැකිය හැකිය.

(අ) එසේ භාවිතා කරන ප්‍රධාන අභිප්‍රේරණ ක්‍රම දෙක උදාහරණ සහිතව දක්වන්න. (ල.2)

(ආ) ව්‍යාපාරයට පාලන ක්‍රියාවලියක් වැදගත් වන්නේ කෙසේදැයි කරුණු දෙකකින් දක්වන්න. (ල.2)

06. i. (අ) මෙහෙයුම් කළමණාකරණයේ මූලික කාර්යය කුමක්ද? (ල.2)

(ආ) ව්‍යාපාරයක මෙහෙයුම් කළමනාකරණ කාර්යයක් ලෙස පර්යේෂණ හා සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ල.2)

ii. (අ) ඔබට ගැළපෙන හා අවශ්‍ය ආකාරයට ඔබේ නිවස සැලසුම් කිරීමේදී යොදාගනු ලබන නිෂ්පාදන ක්‍රමය නම් කර ඊට හේතු දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ආ) නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් දක්වන්න. (ල.2)

iii. පහත දැක්වෙන්නේ යසිරු ටෙක්ස්ටයිල් හි යෙදවුම් හා නිමැවුම් වලට අදාළ දත්ත කිහිපයකි.

(අ) අමුද්‍රව්‍ය ඒකක	8000
යන්ත්‍ර පැය	5000
ශ්‍රමය පැය	4000

බලශක්ති පිරිවැය රු.	240 000
යන්ත්‍ර පිරිවැය	පැයකට රු:35
ශ්‍රම පිරිවැය	පැයකට රු:100
අමුද්‍රව්‍ය පිරිවැය	ඒකකයකට රු:10
මුළු නිමැවුම්	ඒකක 400000

පහත දෑ ගණනය කරන්න.

1. ශ්‍රම ඵලදායිතාවය
2. යන්ත්‍ර ඵලදායිතාවය
3. මුළු ඵලදායිතාවය (ල.3)

(ආ) ශ්‍රම ඵලදායිතාවය වර්ධනය කර ගැනීමට ව්‍යාපාරයකට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල.2)

iv. xyසමාගම සම් ආශ්‍රිත බෑග් හා කුෂන් කවර නිෂ්පාදනය කර අලෙවි කරන සමාගමකි. ඔවුන් අමුද්‍රව්‍ය ලෙස පදම් කළ සම්, සැපයුම් කරුවන්ගෙන් මුදල් ගෙවා ලබා ගනියි. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය සේවා හා ප්‍රමිති සේවා රාජ්‍ය අංශයෙන් ලබා ගනියි. එසේම රාජ්‍ය ආයතන වලටද කුෂන් කවර අලෙවි කරයි. අතරමැදියන් හරහා පාරිභෝගිකයන්ට සම් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරන අතරම රජයට බදු ගෙවන ආයතනයක්ද වේ. එසේම සම් බෑග් හා කුෂන් සඳහා එකතු කළ අගය මත බද්දක්ද ඇති බැවින් භාණ්ඩයේ මිළට බදු බරද එකතු වී ඇත.

ඉහත සිද්ධියේ ඇතුළත් නූතන නුවමාරු ආර්ථිකයේ භාවිතා වන වෙළෙඳපොළ වර්ග උදාහරණ සහිතව දක්වන්න.

v. (අ) අලෙවිකරණ හර සංකල්ප තුල ඇතුළත් හැඟීම හා නිරතවීම යන සංකල්ප පැහැදිලි කරන්න. (සංකල්ප පැහැදිලි කිරීමට2)

(ආ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයෙන් අවධානය යොමු කෙරෙන අංශ හතර දක්වන්න. (ල.2)

07. i. (අ) වෙළෙඳපොළ බණ්ඩනය යන්න හඳුන්වා වෙළෙඳපොළ බණ්ඩනයට යොදා ගන්නා පදනම් හතරක් උදාහරණ සහිතව දක්වන්න. (ල.2)

(ආ) අලෙවිකරණ මිශ්‍රය ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියෙන් සේවා අලෙවිකරණයද ඇතුළත්ව විචල්‍ය 07කින් සමන්විත වේ. මෙය පැහැදිලි කරන්න. (ල.2)

ii. (අ) ව්‍යාපාරයක ආයෝජන තීරණ හා මූල්‍යන තීරණ යන්න පැහැදිලි කරන්න. (ල.2)

(ආ) ආයතනයක් අරමුදල් ආයෝජනය කිරීමේදී සලකා බලන කරුණු හතරක් සඳහන් කරන්න. (ල.2)

iii. සී/ස සහරා සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඇසුරින් පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත.

	රු.
දළ ලාභය	160,000
ශුද්ධ ලාභය බදු පෙර	120,000
වරණීය ලාභාංශ	20,000

වරණීය කොටස්	300,000
සාමාන්‍ය කොටස්	500,000
විකුණුම්	200,000
ගෙවිය යුතු ආදායම් බදු	20,000
ණය පොලී	10,000

ඉහත තොරතුරු ඇසුරින් පහත දක්වා ඇති එක් එක් අනුපාත ගණනය කරන්න.

i. දළ ලාභ අනුපාතය

ii. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

iii. ණය හිමිකාරීත්ව අනුපාතය

iv. පොලී ආවරණ අනුපාතය (ල.4)

iv. අරමුදල් සපයන්නන් හා අරමුදල් ඉල්ලුම්කරුවන් සම්බන්ධ වන ඕනෑම ආකාරයක් මූල්‍ය වෙළඳපොළකි. මූල්‍ය වෙළඳපොලේ සංයුතිය සකස් වන්නේ කෙසේද? (ල.4)

v. (අ) ව්‍යාපාරයකට මානව සම්පත කළමනාකරණය කිරීම වැදගත් වන්නේ ඇයි දැයි හේතු දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ආ) රැකියා විස්තරයක්, රැකියා පිරිවිතරයකින් වෙනස්වන ආකාර දෙකක් දක්වන්න. (ල.2)

08. සුවජීවි නමින් පවත්වාගෙන යන පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක ඇති සුපරීක්ෂක, ගිණුම් ලිපිකරු, වැඩකම්කරු, සාත්තු සේවිකා වැනි රැකියා ඇබෑර්තු කිහිපයක් සඳහා හැකියා හා ධනාත්මක ආකල්ප වලින් යුත් සේවකයන් අද්දවා ගැනීම පිළිබඳව එම ආයතනයේ මානව සම්පත් කළමනාකරු කල්පනා කරයි. ඔහුට ඒ සඳහා අභ්‍යන්තර හා බාහිර සේවක ආකර්ශනයක් සිදු කළ හැකිය.

i. (අ) අභ්‍යන්තර හා බාහිර සේවක ආකර්ශනයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ල.2)

(ආ) ඔහුට බාහිරව සේවකයින් ආකර්ශනය කරගත හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න. (ල.2)

ii. (අ) සේවකයාට හා සේවා යෝජකයාට පත්වීම් ලිපියක් වැදගත් වන්නේ ඇයි දැයි හේතු දෙකක් දක්වන්න. (ල.2)

(ආ) සේවක පුහුණුව හා සංවර්ධනයෙන් සේවකයාට අත්වන ප්‍රතිලාභ හතරක් දක්වන්න. (ල.2)

iii. (අ) කළමනාකරණ ශ්‍රිත අනුව තොරතුරු පද්ධති වර්ග වන ආකාරය දක්වන්න. (ල.2)

(ආ) තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ හතරක් ලියන්න. (ල.2)

iv. (අ) දෛනික කටයුතු සඳහා පුද්ගලයෙකුට අන්තර්ජාලයෙන් ලබාගත හැකි පහසුකම් හතරක් ලියන්න. (ල.2)

(ආ) ව්‍යාපාර සැලැස්මක් පිලියෙල කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ල.2)

v. (අ) ව්‍යාපාරයක් මූල්‍ය වාර්තා විශ්ලේෂණයකදී මූල්‍ය මිනුම් දඬු භාවිතා කරයි. මූල්‍ය නොවන වාර්තා විශ්ලේෂණයකදී මූල්‍ය නොවන මිනුම් දඬු භාවිතා කරයි. එසේ භාවිතා වන මූල්‍ය නොවන මිනුම් දඬු 02ක් දක්වන්න. (ල.2)

(ආ) විධායක සාරාංශයක් ව්‍යාපාරයකට වැදගත් වන්නේ ඇයි දැයි හේතු දෙකක් සඳහන් කරන්න. (ල.2)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2026 - 13 ශ්‍රේණිය
Final Term Test – 2026 – Grade 13

32 S I

පිළිතුරු

(1) - 2
(2) - 2
(3) - 4
(4) - 3
(5) - 3
(6) - 4
(7) - 3
(8) - 5
(9) - 5
(10) - 3
(11) - 2
(12) - 2
(13) - 4
(14) - 1
(15) - 1
(16) - 2
(17) - 3
(18) - 4
(19) - 3
(20) - 3
(21) - 5
(22) - 4
(23) - 4
(24) - 2
(25) - 1
(26) - 4
(27) - 4
(28) - 3
(29)- 2
(30) - 5

31. (අ) කළමනාකරුවන්, සේවකයන්

(ආ) ගෝලීයකරණය, සංස්කෘතිය

32. (අ) තනි, එක් දින ප්‍රතිපත්තීමය

(ආ) බදු, බදු නොවන

33. (අ) 1, 2

(ආ) ඒකාබද්ධ වීම, අත්පත් කර ගැනීම

34. (අ) ආයෝජනය, ප්‍රතිලාභ

(ආ) සංචිත, ප්‍රාග්ධනීකරණය

35. (අ) සේව්‍ය - සේවක, ගිවසුම

(ආ) ස්වයංක්‍රීය - යාන්ත්‍රික

36. (අ) කාර්යයක් , තාක්ෂණික

(ආ) සේවකයන්ගේ, පළමුපෙළ කළමණාකරුවන්ට

37. (අ) අතරතුර, වැළැක්වීමට

(ආ) සහගාමී පාලනය, තොග පාලනය/ තත්ත්ව පාලනය/ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය

38. (අ) සම්පත්, බෙදා හැරීම

(ආ) සමෝධානිත, සමායෝජනය

39. (අ) ආරක්ෂාව, ඇසුරුම

(ආ) භාවිත කිරීම/ ලබා ගැනීම, ප්‍රතිලාභය/ තෘප්තිය

40. (අ) ප්‍රමාණාත්මක, ගුණාත්මක

(ආ) තොරතුරු, ක්‍රියාවලිය

41. ගෝලීයකරණය ව්‍යාප්ත වීම.

විද්‍යුත් ව්‍යාපාර බිහිවීම.

විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම.

පරිසරය පිළිබඳ සැලකිළිමත් වීම.

ව්‍යාපාර සමාජ වගකීම පිළිබඳ සැලකිලිමත් වීම.

42. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව

මධ්‍යම පරිසර අධිකාරිය

ප්‍රාදේශීය සෞඛ්‍යය වෛද්‍ය නිළධාරී කාර්යාලය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

43. සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය

සමාගමේ සංගමික ව්‍යවස්ථා වලිය

සමාගමක ආරම්භක අධ්‍යක්ෂ වරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

සමාගමෙ ආරම්භක ලේකම්වරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

44. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)

ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර (ADM)

චෙක් තැන්පතු යන්ත්‍ර (CDM)

ටෙලි බැංකු පහසුකම්

අන්තර්ජාල බැංකු කටයුතු

ටෙලිවිෂන් බැංකු පහසුකම්

CRM යන්ත්‍රය

45. ආනයන සීමා කිරීම්/ පංගු කිරීම්

අපනයන සීමා කිරීම්/ පංගු කිරීම්

ආනයන/ අපනයන තහනම් කිරීම්

වෙළඳ ගිවිසුම්

දැඩි විනිමය ප්‍රතිපත්ති

46. (1) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීමට නොහැකි වීම.

(2) යන්ත්‍ර වල අක්‍රීය පිරිවැය වැඩි වීම.

(3) සේවක කාලය නිරර්ථක වීම.

(4) හදිසි ඇණවුම් සපුරාලිය නොහැකි වීම.

(5) ව්‍යාපාරයට ඇණවුම් නොලැබී යාම.

47. (1) කෙටි හා සරල වීම.

(2) උච්චාරණය හඳුනාගැනීම මතක තබා ගැනීම පහසුවීම.

(3) නිෂ්පාදනයේ මූලික ගුණාංග ප්‍රයෝජනතාව පිළිබඳ අදහස් ඇති වීම.

(4) පහසුවෙන් වෙනත් භාෂාවකින් හැඳින්විය හැකි වීම.

(5) තරඟකරුවන්ගේ සන්නම වලට වඩා වෙනස් විය යුතු වීම.

48. (1) සමාජ ප්‍රශ්න වර්ධනය වීම.

(2) ජන ජීවිතය අඩාල වීමට හේතු වීම.

(3) වෙළඳපොලෙහි භාණ්ඩ හිඟ වීම.

(4) භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ යාම.

(5) භාණ්ඩ වල ගුණත්වය පහල යාම.

49. (1) T G

(2) 259

50. (1) ව්‍යවසායකයන්/ හවුල් කරුවන් පිළිබඳ

(2) කළමනාකරණය කුසලතා

(3) සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්

(4) සංවිධාන සටහන

(5) වාර්ෂික වියදම්

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2026 - 13 ශ්‍රේණිය
Final Term Test – 2026 – Grade 13

32 S II

පිළිතුරු B

01. (i) (අ) නැත **(ලකුණු 01 යි)**

සපුරා ගැනීම අත්‍යවශ්‍ය නොවන නිසා/ වුවමනාවක් නිසා **(ලකුණු 01 යි)**

(ආ) නවීන මාදිලියේ සුඛෝපභෝගී ගෘහ භාණ්ඩ සැපයීම

වගකීම් සහතික ලබා දීම

අවශ්‍ය ස්ථානයට ප්‍රවාහනය කර දීම

ආනයනික නිෂ්පාදිත අලෙවිය **(කරුණු 04ට ලකුණු 02 යි)**

(ii) (අ) මහ පරිමාණ - 500ක් පමණ සේවකයන් සිටීම

පෞද්ගලික - තනි පුද්ගල අයිතියක් පැවතීම.

(නම් කිරීමට ලකුණු 01 යි පැහැදිලි කිරීමට ලකුණු 01 යි)

(iii) (අ) මිනිස් අවශ්‍යතා වුවමනා සපුරාලීමට - ලී බඩු සැපයීම

සම්පත් වලට අගය එකතු කිරීම - දැව ලබාගෙන නිෂ්පාදිත බවට පත් කර අගය එකතු කිරීම. **(නම් කිරීමට ලකුණු 01 යි පැහැදිලි කිරීමට ලකුණු 01 යි)**

(ආ) අවස්ථාව - පක්ෂපාති ගනුදෙනු කරුවන් සිටීම.

තර්ජනය – ගෝලීය යුධ වාතාවරණය **(ලකුණු 02 යි)**

(iv) (අ) ආසන්න – ගනුදෙනුකරුවන්/ පාරිභෝගිකයන්

– සැපයුම්කරුවන්

– තරඟකරුවන් **(ලකුණු 02 යි)**

සාර්ව – ස්වාභාවික පරිසරය

– ගෝලීය පරිසරය

– තාක්ෂණික පරිසරය

– ආර්ථික **(ආදී ගැලපෙන පරිසර සාධකයන්ට කරුණු 02ට ලකුණු 01)**

(ආ) රැකියා නියුක්තියට දායක වීම.

බදු ගෙවීම

හරිත නිෂ්පාදිත

පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

ප්‍රජා සත්කාරක සේවා **(කරුණු 04 ට ලකුණු 02)**

(v) (අ) පරිසර නීති වලට අනුගත වීම

ගස් සිටුවීම (පරිසර සංරක්ෂණය)

නිෂ්පාදන ක්‍රියාවලියේ දී සම්පත් සුරකීම **(වැනි ගැලපෙන පිළිතුරකට ලකුණු 02)**

(ආ) වෙනස්වන සංකීර්ණ වුවමනා සපුරාලීම

නවෝත්පාදනය

රැකියා උත්පාදනය

ජාතික ආර්ථික සංවර්ධනය **(නම් කිරීමට ලකුණු 02 යි)**

02. (i) (අ) දේශීය සම්පත් භාවිතය

රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම

නීති රීති පිළිපැදීම

සේවා නියුක්තියට දායක වීම

පරිසරයට වන හානි අවම කිරීම **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) කාර්මික සංවර්ධන මණ්ඩලය

අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

ජාතික සංවර්ධන මණ්ඩලය

කාර්මික තාක්ෂණ ආයතනය **(කරුණු 04 ට ලකුණු 02)**

(ii) (අ) ඔව් **(ලකුණු 01)**

ව්‍යාපාරය අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන නිසා 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුතු විට **(ලකුණු 01)**

(ආ) TG 82 **(පියවර 04 ට ලකුණු 02)**

(iii) (අ) TG 81 **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ)

මායා ඇපරල්/ එක් පුද්ගල	**සීමිත සමාගම**
වගකීම අසීමිත වීම	වගකීම සීමිත වීම
පැවැත්ම අඛණ්ඩ නොවේ	අඛණ්ඩ පැවැත්මක් ඇත
නෛතික පුද්ගල භාවයක් නැත	නෛතික පුද්ගල භාවයක් ඇත
ලියාපදිංචිය අනිවාර්ය නැත	ලියාපදිංචිය අනිවාර්ය වේ.

(iv) (අ) වරලත් ව්‍යාපාර ආරම්භ කිරීමේ දී වරලක් ලාභියා හා වරලත් හිමියා අතර ඇති වන ගිවිසුමය. **(ලකුණු 01)**

ව්‍යාපාරය පවත්වා ගෙන යාමට අදාළ නීතිරීති

වරලත් හිමියා විසින් සපයන සේවා හා මුල්‍ය කොන්දේසි

වරලත් ලාභියා ගෙවිය යුතු මූලික ගාස්තුව

මාසිකව ගෙවිය යුතු පුරස්කාරය **(ලකුණු 01)**

(ආ) TG 103 **(වාසි 02 ට ලකුණු 01 අවාසි 02 ට ලකුණු 01)**

(v) (අ) TG 107 **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

මූල්‍ය විනය හා විනිවිදභාවය තහවුරු කිරීම

පුද්ගලික හා පුනර්ජනනීය බලශක්ති ආයෝජන ආකර්ෂණය කර ගැනීම.
ජාතික බලශක්ති සුරක්ෂිතතාව ස්ථාවර කිරීම
රාජ්‍ය අයවැය මත බර අඩු කිරීම තුළින් අරමුදල් සම්පාදනය
තාක්ෂණික නවීකරණය කිරීම
යහපත් පාරිභෝගික/ මහජන සේවාවන් ලබා දීම

03. (i) (අ) ගෝලීය ව්‍යවසායකත්වය ලොව කුමන ස්ථානයක සිටියද තාක්ෂණය භාවිතයෙන් ලෝකයේ වෙනත් ඕනෑම රටක් හෝ ස්ථානයක් සමඟ සන්නිවේදනයේ යෙදී දේශසීමා වලින් බැහැරව වෙළෙඳාම් කිරීමය. **(ලකුණු 01)**

(ආ) <u>අභියෝග</u>

සංස්කෘතීන් අතර වෙනස් කම් පැවතීම
ජාතීන් අතර පවතින ගැටලු **(කරුණු 02 ට ලකුණු 02)**

(ii) (අ) ✳ විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

උදා: ජංගම දුරකථනය රු:60000 කට මිල දී ගැනීම.

✳ වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම

උදා: රු:60,000 කට ජංගම දුරකථනය මිල කිරීම.

✳ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම.

උදා: රු:10,000 ක් බැංකුවේ තැන්පත් කිරීම.

✳ විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

උදා: රු:10,000 ක් යොදවා බැංකු ණය වාරිකය ගෙවීම.

(කාර්යයන් 02 ට ලකුණු 01 උදාහරණ 02 ට ලකුණු 01)

(ආ) ව්‍යවහාර මුදල් - වලංගු මුදල්

ආසන්න මුදල් – බැංකුවේ ඉතුරුම් තැන්පතු

(මුදල් වර්ග නම් කිරීමට ලකුණු 01 යි පැහැදිලි කිරීමට ලකුණු 01)

(iii) (අ)

	බලපත්‍රලාභී වාණිජ බැංකු	**බලපත්‍ර මුදල් සමාගම්**
✳ජංගම ගිණුම් පවත්වාගෙන යාම	අවසර ඇත	අවසර නැත
✳ විදේශ විනිමය ගනුදෙනු	සිදු කිරීමට අවසර නැත	අවසර නැත
✳ මුදල් මැවීමේ හැකියාව	ඇත	නැත
✳ බැංකු අයිරා	ලබා දේ	ලබා නොදේ
✳ ආරම්භක ප්‍රාග්ධනය	විශාලය	සාපේක්ෂව කුඩාය
✳ බලපානු ලබන නීතිය	1988 අංක 30 දරණ බැංකු පනත	2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනත

(සුදුසු කරුණු 02 ක් සැසඳීමට ලකුණු 02 යි)

(අ) TG 140 **(කරුණු 04 ට ලකුණු 02)**

(iv) **(අ)** චෙක්පත රේඛනය කිරීම

තීන්ත පෑනක් භාවිත කිරීම

නිවැරදිව චෙක් පත පිරවීම

මුදල නිවැරදිව සඳහන් කිරීම

අත්සන පිළිබඳ සැලකිලිමත් වීම

චෙක්පත විධානයට ලිවීම/ හෝ රැගෙන එන්නාට යන පදය කපා හැරීම

ලිවීමට අදාළ විස්තර චෙක්පොතේ පිළිපතෙහි සටහන් කර ගැනීම

(කරුණු 04 ට ලකුණු 02)

(අ) චෙක්පතෙහි මුහුණත සඳහන් ආකාරයටම ආදායකයා සිය නම චෙක්පතෙහි පිටුපස ලිවීම චෙක්පත් පිටසන් කිරීමයි. **(ලකුණු 01)**

<u>පිටසන අවශ්‍ය වන අවස්ථා</u>

ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේ දී

විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේ දී

රේඛනය නොකරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී

(කරුණු 02 ට ලකුණු 01)

(v) **(අ)** දායකත්ව මූලධර්මය **(ලකුණු 01)**

පැහැදිලි කිරීමට **(ලකුණු 01)**

(ආ) ජීවිත රක්ෂණය - ලක්මාල්ගේ ජීවිතය

මාර්ගස්ත භාණ්ඩ රක්ෂණය - නිෂ්පාදිත වෙළෙඳපොලට ප්‍රවාහනය

මාර්ගස්ත මුදල් රක්ෂණය - එක් තැනක සිට තව තැනකට මුදල් රැගෙන යාම

වගකීම් රක්ෂණයන් - වෙනත් අයට වන පාඩු අවරණය

මෝටර රථ රක්ෂණය - රථ වාහන

(ගැලපෙන පරිදි ලියා ඇති රක්ෂණාවරණ 4 ක් හා අවස්ථා හතරක් ලියා ඇත්නම් ලකුණු 02)

04. (i) පණිවුඩය යවන්නා – ප්‍රධාන විධායක නිළධාරී

පණිවුඩය – 2026 අගෝස්තු මස 05 වන දින පවත්වනු ලබන ධාරිතා සංවර්ධන වැඩසටහනට සියලුම සේවකයින් සහභාගී කරවන්න.

මාධ්‍ය – ලිඛිත මාධ්‍ය

ලබන්නා – සියලු කළමනාකරුවන්

ප්‍රතිචාරය – පණිවුඩය ලද පසු කළමනාකරුවන් විසින් ඒ පිළිබඳ අදාළ කටයුතු සුදානම් කිරීම.

ප්‍රතිපෝෂණය – අවශ්‍ය කටයුතු සුදානම් කළ බව ප්‍රධාන විධායක නිළධාරිව ලිපියක් මගින් දැනුවත් කිරීම.

(උදාහරණ සහිත කරුණු 5ට ලකුණු 04 යි)

(උදාහරණ සහිත කරුණු 4ට ලකුණු 04 යි)

(ii) (අ) <u>**ව්‍යාපාරිකයාට**</u>

අමුද්‍රව්‍ය කලට වෙලාවට සපයා ගැනීම.
නිමි ද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීම.
සේවකයින් නියමිත වෙලාවට ගෙන්වා ගැනීමට
ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට
වෙළෙඳපොළ ව්‍යාප්තියට **(කරුණු 02 ට ලකුණු 04)**

<u>**ආර්ථිකයට**</u>

සේවා නියුක්තිය වර්ධනය වීම.
ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම.
විදේශ වෙළෙඳාම වර්ධනය වීම. **(කරුණු 02 ට ලකුණු 01)**

(ආ) ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම හා ගොඩනැගිල්ල තුළ චලනය කිරීමේ ඉඩකඩ
ද්‍රව්‍ය භාවිතයේ වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන් කිරීමේ අවශ්‍යතාව
ප්‍රධාන සම්බන්ධතා වලට ආසන්න බව
ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව
ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වාභාවය
පිරිවැය **(කරුණු 04 ට ලකුණු 02)**

(iii) (අ) TG 208 **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) ප්‍රවාහන පිරිවැය අධික වීම
වෙළෙඳ ද්‍රව්‍ය හා සේවකයන් ප්‍රවාහනයේ ගැටළු
ජාත්‍යන්තර වෙළෙඳාමට බාධා මතු වීම. **(ගැලපෙන කරුණු 02 ට ලකුණු 02)**

(iv) (අ) ස්වාභාවික සම්පත් බෙදීයාමේ විෂමතාවය
සාපේක්ෂ පිරිවැය වාසිය
සමහර නිෂ්පාදිත සම්බන්ධව සමහර රටවලට නීතිමය ඒකාධිකාරියක් පැවතීම
භාණ්ඩ ප්‍රවර්ධනය
වෙළඳ බාධක අවම වීම. **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) වෙළෙඳාමේදී අපනයන කරුට මුදල් ගෙවීම සහතික වීම සිදු වන බැවින් වෙළෙඳ ගනුදෙනු අඛණ්ඩව කරගෙන යාමට හා විශ්වාසය තහවුරු කිරීමට.

(අර්ථය සහිත පිළිතුරකට ලකුණු 02)

(v) (අ) TG 254 **(කරුණු 04 ට ලකුණු 02)**

අ) TG 237 **(කරුණු 04 ට ලකුණු 02)**

05. (i) (අ) ගතික ව්‍යාපාර පරිසරය – නිතර වෙනස්වන අභ්‍යන්තර හා බාහිර පරිසරය

සංවිධානය / ආයතන – පොදු පරමාර්ථයක් වෙනුවෙන් එක්ව වැඩ කරන පුද්ගල එකතුවක්

පරමාර්ථ, අරමුණු – දිගුකාලයේ දී අපේක්ෂිත ප්‍රතිඵල පරමාර්ථ කෙටි කාලයේදී ඇත්පත් කර ගැනීමට අපේක්ෂා කරන දෑ අරමුණු වේ.

සඵලදායීව – ආයතනයක් කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු නිවැරදිව ලඟා කරගනු ලබන්නේ ද යන්න සඵලදායකත්වය වේ.

ව්‍යාපාර සම්පත් – ව්‍යාපාර කටයුතු සඳහා යෙදවුමක් ලෙස භාවිතා කරන සියලු දේ.

මානව සම්පත්	භූමිය
භෞතික සම්පත් හෝ	ශ්‍රමය
මූල්‍ය සම්පත්	ප්‍රාග්ධනය
තොරතුරු සම්පත්	ව්‍යවසාය
කාලය	

කාර්යක්ෂමතාව – අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම නිමවුමක් ලඟා කර ගැනීම.

ක්‍රියාවලිය – එකිනෙකට සම්බන්ධ අඛණ්ඩව පවත්නා ක්‍රියාකාරකම් සමූහයක එකතුවක්

(සංකල්ප 04 නම්කර පැහැදිලි කිරීමට ලකුණු 02)

(අ)

- ❖ ලාභ උපරිම කර ගැනීමට
- ❖ සමස්ථ සුභ සාධනයට
- ❖ වෙළඳපොළ පුළුල් කර ගැනීමට
- ❖ වෙළෙඳපොළ කොටස වැඩි කර ගැනීමට
- ❖ ව්‍යාපාර ගමන් මග තීරණය කර ගැනීමට
- ❖ ව්‍යාපාර කටයුතු සැලසුම් කර ගැනීමට
- ❖ ව්‍යාපාරයේ සාර්ථකත්වය මැන බැලීමට
- ❖ සීමිත සම්පත් අංශ අතර බෙදා හැරීමට **(කරුණු 04 ට ලකුණු 02)**

(ii)

ප්‍රධාන භූමිකා	උප භූමික	කාර්යය
අන්තර් පුද්ගල භූමිකා	ආයතන ප්‍රධානියා	ත්‍යාග ප්‍රධානෝත්සවයේ අමුත්තන් පිළිගැනීම
තොරතුරු භූමිකාව	නියාමක	පසුගියවාරයේ ප්‍රගතිය මත ඉදිරි වැඩ සැලසුම් සකස් කිරීම.
තීරණ භූමිකාව	බාධා පාලනය කරන්නා	හිඟ ලී බඩු වලට පොළිය යෙදීම

(ලකුණු 04)

(iii) **(අ)** TG – 26 **(ලකුණු 02)**

(ආ) TG – 28 **(ලකුණු 02)**

(iv) **(අ)** කාර්ය අභිමුඛ නායකත්වය **(ලකුණු 02)**

(ආ) ප්‍රියජනක බව

උසස් පෞරුෂත්ව ලක්ෂණ

බුද්ධිමත් බව

ආත්ම විශ්වාසය

කායික හා මානසික නිරෝගී බව

ස්වයං විනය

අධිෂ්ඨානය

කැපවීම **(කරුණු 04ට ලකුණු 02)**

(v) (අ) <u>මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම</u>

වැටුප්

කොටස් හිමිකාරත්වය ලබා දීම.

ප්‍රසාද දීමනා ලබා දීම.

ණය පහසුකම් ලබා දීම.

ආයතනයේ නිෂ්පාදිත සහන මිලට ලබා දීම.

නිෂ්පාදිත දිරි දීමනා ලබා දීම.

<u>මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම.</u> **(අභිප්‍රේරණ ක්‍රම 2 ට $^1/_2$ බැගින් ලකුණු 01)**

සේවකයන් පුහුණු කිරීම **(උදාහරණයකට $^1/_2$ බැගින් ලකුණු 01)**

උසස් වීම් ලබා දීම.

රැකියා සුරක්ෂිත බව ඇති කිරීම.

යෝග්‍ය වැඩ පරිසරයක් ඇති කිරීම.

TG 46

(ආ) * නිෂ්පාදිතයේ ගුණාත්වය ආරක්ෂා කර ගැනීම.

* පිරිවැය අවම කර ගත හැකි වීම.
* පුද්ගලයන් අතින් සිදුවන වැරදි අවම කර ගැනීමට හෝ ශූන්‍ය කර ගැනීමට හැකි වීම.
* පරිසරයේ වෙනස් වීමට අනුව ගැලපීමට හැකියාව ලැබීම.
* ආයතනයේ ප්‍රගතිය නිරීක්ෂණයට හා වැරදි නිවැරදි කර ගැනීමට හැකි වීම.
* ආයතනයේ කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට සිදු වන බව තහවුරු කිරීම.

(කරුණු 02ට ලකුණු 02)

06. (i) (අ) නිෂ්පාදන ක්‍රියාවලිය තුල භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීම හෝ යෙදවුම් නිමැවුම් බවට පරිවර්ථනය කිරීම. **(ලකුණු 02)**

(ආ) පවත්නා නිෂ්පාදිතය පිළිබඳවත්, නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳවත්, නව නිෂ්පාදන සැලැසුම් පිළිබඳවත්, තොරතුරු ඒකරාශී කිරීම හා ඒවා වැඩි දියුණු කිරීම. **(ලකුණු 02)**

(ii) (අ) කාර්ය නිෂ්පාදනය **(ලකුණු 01)**

හේතු -ගනුදෙනු කරුගේ අවශ්‍යතාව අනුව ඉටු කළ හැකි වීම.

පාරිභෝගික තෘප්තිය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම **(හේතු 2ට ලකුණු 01)**

(ආ) * නිෂ්පාදිතයේ ස්වාභාවය

* වෙළෙඳපොළ ප්‍රමාණය
* යොදා ගන්නා තාක්ෂණය හා අවශ්‍ය උපකරණ
* දැරිය යුතු පිරිවැය
* මිලදී ගැනීමේ රටාව
* සම්පත් ලබා ගැනීමේ පහසුව **(කරුණු 04 ට ලකුණු 02)**

(iii) (අ) ශ්‍රම ඵලදායිතාවය = $\frac{\text{නිමැවුම}}{\text{ශ්‍රම පැය ගණන}}$

$\frac{400\,000}{4000}$ =100

යන්ත්‍ර ඵලදායිතාවය = $\frac{\text{නිමැවුම}}{\text{යන්ත්‍ර සූත්‍ර යෙදවීම}}$

$\frac{400\,000}{5\,000}$ = 80

මුළු ඵලදායිතාව = $\frac{\text{නිමැවුම}}{\text{යෙදවුම්}}$

$\frac{400000}{825000}$

$\underline{\underline{0.484}}$


8 000*10	= 80 000
5 000*35	= 105 000
බල ශක්තිය	=240 000
4 000*100	= 400 000
යෙදවුම්	= 825 000

(ලකුණු 03)

(ආ) * පුහුණු කිරීම.

* පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීම.
* මූල්‍ය හා මූල්‍ය නොවන සේවක දිරිගැන්වීම් යොදා ගැනීම.
* තත්ත්ව කව යොදා ගැනීම.
* මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම. **(ලකුණු 04)**

(iv) (අ)



(වෙළඳපොළ වර්ග 4 ක් සහිත රූප සටහන හෝ පැහැදිලි කිරීමට ලකුණු 04 යි)

(වෙළඳපොළ වර්ග 4 ට ලකුණු 02යි උදාහරණ 04ට ලකුණු 02 යි)

(v) (අ) සන්නිවේදන මාධ්‍ය අතරින් තමා භාවිතා කරණ මාධ්‍ය කොතරම් විෂය පථයක් ආවරණය වන වාද යන්න ව්‍යාපාරිකයාගේ දෘෂ්ඨිය, හැඟීම ලෙස අදහස් කරයි.
සන්නිවේදන මාධ්‍ය කෙරෙහි පාරිභෝගිකයා කෙතෙරම් දුරට අවදානය යොමු කරන්නේද සක්‍රීයව සම්බන්ධ වන්නේද යන්න නිරතවීමෙන් අදහස් වේ. **(කරුණු 2ට ලකුණු 02)**

(ආ) සම්බන්ධතා අලෙවිකරණය
සමෝදානිත අලෙවිකරණය
අභ්‍යන්තර අලෙවිකරණය
කාර්ය සාධනය අලෙවිකරණය **(කරුණු 4ට ලකුණු 02)**

07. (i) (අ) වෙළඳපොළ ඛණ්ඩනය යනු විෂම ගති ලක්ෂණ වලින් යුත් සමස්ථ වෙළෙඳපොළ සමජාතීය ගති ලක්ෂණ වලින් යුත් කණ්ඩායම් වලට බෙදා වෙන් කිරීමයි. **(ලකුණු 01)**

භූගෝලීය සාධක	-	රටවල් දේශගුණ සාධක, නගර විශාලත්වය
ප්‍රජා විද්‍යාත්මක සාධක	-	ස්ත්‍රී පුරුෂ, වයස, ආදායම, පවුලක ප්‍රමාණය
මනෝවිද්‍යාත්මක සාධක	-	සමාජ පන්ති, ජීවන රටාව, පෞරුෂත්වය
චර්යාත්මක සාදක	-	ප්‍රතිලාභ, මිලට ගන්නා අවස්ථා, භාවිතා කරන්නාගේ තත්වය

TG 111 **(ලකුණු 01)**

(ආ) අලෙවිකරණ මිශ්‍රය

4ps
- නිෂ්පාදිතය
- මිල
- ස්ථානය
- ප්‍රවර්ධනය

3ps
- මිනිස්සු
- ක්‍රියාවලිය
- භෞතික වටපිටාව

4ps + 3ps = 7ps අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය 4ට සේවා අලෙවිකරණය මිශ්‍රයේ විචල්‍ය 3 එක් වූ පසු 7ps **(ලකුණු 02)**

(ii) (අ) ව්‍යාපාරයක් සතු අරමුදල් ව්‍යාපාරය තුළ හෝ පිටත වත්කම් යෙදවීම පිළිබඳ ගන්නා තීරණ ආයෝජන තීරණ වේ.

<u>නැතහොත්</u>

අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම් වල යෙදවීම පිළිබඳව ගනු ලබන තීරණ ආයෝජන තීරණය වේ.

ජංගම හා ස්ථාවර වත්කම් වල ආයෝජනය සඳහා අරමුදල් සපයා ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණ මූල්‍යන තීරණ වේ. **(ලකුණු 02)**

(ආ) ආයෝජනයේ ප්‍රතිලාභ — ආයෝජනයේ පිරිවැය

ආයෝජනයේ අවධානම — නීතිමය තත්වය

ද්‍රවශීලතාව — මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට ඇති කරන බලපෑම්

පරිසර සාධක

අවිනිශ්චිතතා

ආයතනයේ ප්‍රතිපත්ති **(ලකුණු 02)**

(iii) (අ) දළලාභ අනුපාතය

$$\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

$$\frac{160\,000}{200\,000} \times 100$$

$$20\%$$

$$\text{හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{බදු පසු ශුද්ධ ලාභය - ලාභාංශය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 10000$$

$$\frac{120{,}000 - 20000}{500000}$$

$$20\%$$

$$\text{පොලී ආවරණ අනුපාතය} = \frac{\text{පොලී හා බදු පෙර ලාභය}}{\text{පොලිය}}$$

$$\frac{10{,}000 + 120{,}000}{10000}$$

$$\frac{130\,000}{10\,000}$$

වාර 13 **(ලකුණු 04)**

(iv) (අ) අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ

දේශීය විදේශීය විනිමය වෙළඳපොළ

රජයේ සුරකුම්පත් වෙළඳපොළ

භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

භාණ්ඩාගාර බැදුම්කර වෙළඳපොළ

සංගමික ණය සුරුකුම්පත් වෙළඳපොළ

Past Papers Wiki

වාණිජ පත්‍රිකා වෙළඳපොළ
සංගමික බැදුම්කර වෙළඳපොළ
කොටස් වෙළඳපොළ **(පිළිතුරු 9 හා 8 ලකුණු 04)**

(පිළිතුරු 7 හෝ 6 ලකුණු 03)

(පිළිතුරු 5 හා 3 අතර එකකට $^1/_2$ බැගින්)

(v) (අ) * අනෙකුත් සම්පත් වලට සාපේක්ෂව මානව සම්පත සප්‍රාණික නිසා සිතීමට, හැඟීමට, දැනීමට ප්‍රතික්‍රියා කිරීමට හැකියාව ඇත.

* අනෙකුත් සියලුම සම්පත් පිළිබඳ තීරණ ගන්නේ මානව සම්පතය. ව්‍යාපාරයකට දිගුකාලීනව තරඟකාරී වාසි ලැබීමට ව්‍යාපාරය නොනැසී පවත්වාගෙන යාමට, යොදා ගත හැකි එකම තීරණ සාධකය නිසා. **(ලකුණු 02)**

(ආ) TG 194 **(වෙනස්කම් 2ට ලකුණු 02)**

08. (i) (අ) TG 205 **(වාසි 2ට ලකුණු 01, අවාසි 2ට ලකුණු 01)**

(ආ) TG205 **(ලකුණු 02)**

(ii) (අ) 1. ආයතනය හා සේවකයන් අතර සම්බන්ධතාව තහවුරු කළ හැකි මූලික ලියවිල්ලක් වීම.

2. ආයතනය හා සේවකයා නෛතිකව බැඳී ඇති බවට ගිවිසුමක් ලෙස සැලකීමට හැකි වීම.

TG 211 **(කරුණු 2ට ලකුණු 02)**

(ආ) 1. රැකියාවේ තෘප්තිය වැඩි වීම.

2. කාර්යය සාධනය ඉහළ යාම නිසා වැටුප් වැඩි වීම.

3. උසස් වීම් ලැබීමේ ඉඩකඩ

4. සේවක දැනුම කුසලතා ආකල්ප වර්ධනය වීමෙන් සේවක වටිනාකම ඉහළ යාම.

TG 217 **(කරුණු 4ට ලකුණු 02)**

(ii) (අ) අලෙවිකරණ
මූල්‍ය
මෙහෙයුම්
මානව සම්පත්
පර්යේෂණ හා සංවර්ධන **(කරුණු 4ට ලකුණු 02)**

(ආ) වේගවත් බව
නිවැරදිතාව
නම්‍යශීලි බව
විශ්වාසවන්ත බව
ගුණාත්මක බව
වැඩි තොරතුරු ප්‍රමාණයක් කළමණාකරනය කිරීම **(කරුණු 4ට ලකුණු 02)**

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iv) **(අ)** විද්‍යුත් තැපැල් පහසුකම්

වෙබ් අඩවි නැරඹීම

අන්තර්ජාල සංවාද

දුරකථන පහසුකම්

ලිපිගොනු හුවමාරුව

TG 264 **(කරුණු 4ට ලකුණු 02)**

(ආ) පැහැදිලි ඉම

ගනුදෙනුකරුවෝ

ඉලක්ක

අවශ්‍ය මූල්‍ය සම්පත් **(කරුණු 2ට ලකුණු 02)**

(v) **(අ)** ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කරන්නේද

අපේක්ෂිත ව්‍යාපාරයට අවශ්‍ය අමුද්‍රව්‍ය තිබෙනවාද

අපේක්ෂිත ව්‍යාපාරය ක්‍රියාත්මක කළ හැකිද **(කරුණු 2ට ලකුණු 02)**

(ආ) විධායක සාරාංශය සමස්ථ ව්‍යාපාර සැලැස්ම පිළිබඳ පෙර දැක්ම ඇති කිරීම.

ව්‍යාපාර සැලැස්ම පිලිබඳ මග පෙන්වීමක් ලබා දීම.

ව්‍යාපාර සැලැස්ම පිළිබඳ විශ්වාසයක් ඇති කිරීම. **(කරුණු 2ට ලකුණු 02)**

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank